කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි සිව්වන වසර පරීක්ෂණය (බාහිර)-2021

2024 - අගෝස්තු

**BCOM E 4082 - සංස්ථාපිත ආචාරධර්ම සහ යහපාලනය**

මුළු ප්‍රශ්න සංඛ්‍යාව හතරයි : (04) කාලය : පැය 02 යි

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

---

**ප්‍රශ්න අංක - 01**

ABC සමාගම යනු පාරිභෝගික ඉලෙක්ට්‍රොනික උපකරණ පිළිබඳ විශේෂිත වූ මධ්‍යම ප්‍රමාණයේ නිෂ්පාදන සමාගමකි. ගෝලීය ආර්ථිකයේ සීඝ්‍ර වෙනස්වීම් වලට ප්‍රතිචාර වශයෙන් සිය ව්‍යාපාරික උපායමාර්ගය යලි නිර්වචනය කිරීමට උත්සාහ කරන සන්ධිස්ථානයක සමාගම මේ වන විට සිටී. ව්‍යාපාරයේ මූලික අරමුණ සහ එය නිදහස් වෙළඳපල රාමුව තුල ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳ අභ්‍යන්තර වාද විවාද වර්ධනය වෙමින් පවතින බව ප්‍රධාන විධායක නිලධාරියා දැක ඇත.

ගැටළු ප්‍රකාශය : උපාය මාර්ගික උපදේශකයෙකු ලෙස, පහත සඳහන් ප්‍රශ්න පිළිබඳව සමාගමේ විධායක කණ්ඩායම සමඟ සාකච්ඡාවක් මෙහෙයවීමට ඔබෙන් ඉල්ලා ඇත.

අ. ව්‍යාපාර යන්න පැහැදිලි කර එහි අරමුණු දැක්වීම.

(ලකුණු 05)

ආ. ව්‍යාපාර වර්ග හතර හඳුන්වා උදාහරණ සහිතව පැහැදිලි කිරීම.

(ලකුණු 05)

ඇ. ධනවාදය හා මූල්‍ය වෙළඳපොල සමඟ නිදහස් වෙළඳපොලේ සම්බන්ධය පැහැදිලි කිරීම.

(ලකුණු 05)

ඉ. ABC සමාගමට නිදහස් වෙළඳපොල පද්ධතියක කටයුතු කිරීමෙන් ලබාගත හැකි වාසි අවාසි පැහැදිලි කිරීම.

(ලකුණු 10)

(මුළු ලකුණු 25)

**ප්‍රශ්න අංක - 02**

අ. ආයතනික පාලනය තුල අධ්‍යක්ෂක මණ්ඩලයේ භූමිකාව විස්තර කරන්න.

(ලකුණු 06)

ආ. ආයතනයක අධ්‍යක්ෂක වරයෙකු වීමට නම් තිබියයුතු සුදුසුකම් ලැයිස්තුගත කරන්න.

(ලකුණු 07)

ඉ. ආයතනික පාලන ප්‍රමිති පිළියෙල කිරීමේ ක්‍රියාවලියේදී අවශ්‍ය වන ආයතන, නීතිරීති රෙගුලාසි සහ ප්‍රාථමික කාර්යන් පැහැදිලි කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 25)

**ප්‍රශ්න අංක - 03**

අ. වෘත්තීය ගණකාධිකාරිවරයෙකුට අදාල වෘත්තීය මූලධර්ම නම් කරන්න.

(ලකුණු 06)

ආ. "වෘත්තීය ගණකාධිකාරිවරයෙකු ගේ මූලික මූලධර්ම පිළිපැදීමට තර්ජනයක් විය හැකි විවිධ තත්වයන් පවතී." මෙම තර්ජන පිලිගත හැකි මට්ටමකට තුරන් කිරීමට හෝ අඩුකිරීමට හැකි ආරක්ෂණ වැටෙනා පුළුල් කාණ්ඩ තුන හඳුන්වන්න.

(ලකුණු 07)

ඇ. කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කර ඇති ආයතන අධීක්ෂණය සඳහා රෙගුලාසි පැවතිමේ වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 25)

**ප්‍රශ්න අංක - 04**

කෙටිසටහන් ලියන්න.

අ. දායකත්වය සඳහා පිරිනැමීම හා විකිණීම සඳහා පිරිනැමීම.
(Offer to contribute and offer to sell.)

ආ. සමාගම විසින් කොටස් අත්පත් කරගැනීම හෝ නිදහස් කිරීම.
(Acquisition or release of a company stocks.)

ඇ. පවරා ගැනීම හා ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය (Acquisition and Integration Code)

ඉ. ස්වේච්ඡා දීමනාව හා අනිවාර්ය දීමනාව
(Voluntary allowance and compulsory allowance)

ඊ. කැමැත්ත පිළිබඳ ගැටළු ( conflict of interest)

(මුළු 05x05 )
(මුළු ලකුණු 25)